# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022 - 12 - 21 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : ඩබ්.පී.එන්. ප්‍රියංගිකා විජේසිංහ මිය,
Q1, මහවැලි නිවාස,
පැලටියාව, පොලොන්නරුව.

වගඋත්තර පාර්ශවය : 01. සභාපති,
විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
234, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

02. සාමාන්‍යාධිකාරී (සුභසාධන)
විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
234, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

03. ජ්‍යෙෂ්ඨ කළමණාකරු,
ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය,
නො 13, නාරාහේන්පිට පාර,
නාවල.

<u>පැමිණිලි අංකය : එච්ආර්සී/3466/15</u>

<u>පැමිණිල්ල:-</u>

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා 2013.03.16 වනදින ගෘහ සේවිකාවක් වශයෙන් සෞදි අරාබියේ සේවයට ගිය අතර, එහිදී දරුණු වධහිංසාවලට ලක්වීම හේතුවෙන් ඒ පිළිබඳව CD 698/1306 යටතේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පැමිණිල්ලක් ගොනු කළ බවත්, එම පැමිණිල්ල විභාග කිරීම සඳහා කිහිපවරක් එම කාර්යාංශයට පැමිණියද සාධාරණයක් ඉටු නොවූ බවත්ය. එම දරුණු වධහිංසාවලට ලක්වීම නිසා තමා හට නැවත රැකියාවක් කිරීමේ හැකියාවක් නොමැති බවත් ඒ හේතුවෙන් දැඩි ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුව ඇති බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත. පැමිණිල්ලේ කරුණු අනුව පැමිණිලිකාරිය සේවය කළ කාල සීමාව තුළ විටින් විට වධහිංසාවලට මුහුණ දීමට සිදුව ඇති අතර, තමාගේ එක් පාදයකට කම්බි කැබලි 14ක් ඇතුළත් කර ඇති බවටද තමාගේ එක් කණකට පහරදීමක් සිදුව ඇති බවටද කරුණු ඉදිරිපත් වී ඇත.




| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary: 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996 | වෙබ් / இணையம் / Web: www.hrcsl.lk |

මෙම පැමිණිල්ලට අදාලව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත කරන ලද දැනුම්දීමට අනුව වගඋත්තර පාර්ශවය විසින් CD/698/1306 දරණ වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ සමග විදේශ සේවා නියුක්ති කාර්යාංශය ගන්නා ලද පියවර පිළිබඳ ඇමුණුම් ද ඉදිරිපත් කර ඇත. එහි මෙම පැමිණිලිකාරියගේ මෙරට විදේශ නියෝජිත වන සත්ජ්ෂියන් ට්‍රැවල්ස් ආයතනය පැමිණිලිකාරිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඇති අතර, සේවිකාව හා සම්බන්ධ එරට නියෝජිත වෙතින් ගැටළුව විසඳීමට උත්සහ කල අවස්ථාවේ ඇයගේ පාදයට කම්බිකූරු ඇතුලත් නොකල බවත්, රටඉදි කැඩීමට ගිය අවස්ථාවේදී රටඉදි කටු තම පාදයේ ඇනුනු බවත්, තම සේවා ස්ථානයේ මන්දමානසික අයකු සිටින බැවින්, ඇයගෙන් වන හිරිහැර නවතා දෙන ලෙස සේවිකාව ඉල්ලා ඇති බවත්, තවදුරටත් එම ස්ථානයේ රැඳී සිටින බවද මෙම සේවිකාව විසින් ප්‍රකාශ කර ඇති බවත් වන්වා ඇත.

තවද, 2013.09.18 දින පැමිණිලිකාරිය දේශීය නියෝජිත අතර පැවැති පරීක්ෂණයේදී සේවක මහත්මියට සිදුව ඇතැයි කියන හිරිහැර හා ශාරීරික හිංසාවන් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම සඳහා විදේශ නියෝජිත මගින් සෞදි අරාබියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට ඉදිරිපත් කර ඒ පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙසට දේශීය නියෝජිතට නියෝග කර ඇති බවත්, ඉහත නියෝගය ඉටු කිරීමට දේශීය නියෝජිත අසමත් වී ඇති බැවින්, දේශීය නියෝජිත ආයතනයේ අනුමැතිත් අත්හිටුවා ඇති බවත් දක්වා ඇත. තවද දේශීය නියෝජිත එය නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් ඔහුට දඩුවමක් ලෙස ඔහුගේ සියළු අනුමැතින් අත්හිටුවීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ක්‍රියා කර ඇති බවත් දක්වා ඇත.

තවද එම වාර්තාවට අනුව 2015.03.03 වන දින මෙම පැමිණිලිකාරිය ලංකාවට පැමිණ ඇති අතර, ඇයට සේවා ස්ථානයේ දී සිදුව ඇතැයි පවසන හිංසාවන් සම්බන්ධයෙන් හා අසනීප තත්වයන් සම්බන්ධයෙන් එරට රැකියා නියෝජිතට දැන්වීමෙන් පසු වෛද්‍ය ප්‍රතිකාර සඳහා රුපියල් පනස් දහසක මුදලක් වාර දෙකකදී සේවක මහත්මිය වෙත ගෙවා ඇති බව ලේඛන අනුව තහවුරු වේ. එම මුදල 2015.06.22 දින සහ 2015.08.04 දින කොටස බැගින් පැමිණිලිකාරියගේ නමින් සෙලාන් බැංකුව වෙත බැරකර ඇති බව නිරීක්ෂණය වේ. තවද මෙම පැමිණිලිකිරිය ලංකාවට පැමිණීමෙන් පසු ඇයගේ අසනිප තත්වය සඳහා රක්ෂණ වන්දි හා ආපසු පැමිණීමේ ගුවන් ටිකට්පත් ගාස්තු ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර, එම ගෙවීම රක්ෂණ ආයතනය විසින් ප්‍රතික්ෂේප කර ඇති බවද දක්වා ඇත.

මෙහිදී පැමිණිලිකාරිය සඳහන් කර ඇත්තේ, රක්ෂණ සමාගමෙන් ලබාදෙන ලබන වන්දි මුදල ප්‍රමාණවත් නොවන බැවින්, ඒ සම්බන්ධයෙන් සොයා බලා වැඩි වන්දි මුදලක් ලබා දෙන ලෙසයි. විශේෂයෙන්ම මෙම පැමිණිලිකාරියට විදේශ නියෝජිත ආයතනය විසින් හා රක්ෂණ සමාගමෙන් ලබාදුන් වන්දි මුදලට අමතරව නීත්‍යානුකූලව ලබාදිය හැකි යම් සහනයක් තිබේද යන්න පිළිබඳ කොමිෂන් සභාවේ අවධානය යොමු කොට ඇත. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය දක්වා ඇත්තේ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සියන් (MBSL) රක්ෂණ සමාගමත් අතර ඇතිකරගත් ගිවිසුම් වලට අනුව රක්ෂණයෙන් ආවරණය කරනු ලබන්නේ විදේශගත ශ්‍රමිකයෙකු අදාල කොන්ත්‍රාත් කාලය ඇතුලත හදිසි අසනීපයක් මත හෝ වධහිංසාවක් මත හෝ හදිසි අනතුරක් යන හේතු තුනක් මත එම කොන්ත්‍රාත් කාලය ඇතුලත ලංකාවට පැමිණියහොත් රක්ෂණයෙන් ආවරණය වන බවත්, ඊට අදාල ගුවන්ගමන් ටිකට්පත් මුදල වන රු.25552.24 ක මුදල ලබා දෙන බවත්ය. එම මුදල පැමිණිලිකාරියට ගෙවා ඇති බව වගඋත්තර පාර්ශවය දක්වා ඇත. තවද එම ගිවිසුමේ උපලේඛණ අංක 1 අනුව නැවත ලංකාවට පැමිණීම යටතේ 1.1 උපලේඛනය ප්‍රකාරව මෙම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් කටයුතු කර ඇති බවද සදහන් කර ඇත.

<u>නිරීක්ෂණ :-</u>

ඉහත කී කරුණු සලකා බැලීමේදී පැහැදිලි වන්නේ මෙම පැමිණිලිකාරිය විදේශ රැකියාව සදහා ගෘහ සේවිකාවක් වශයෙන් සත්ජ්ෂියන් ට්‍රැවල්ස් ආයතනය හරහා 2013.03.16 වන දින සෞදි අරාබි රටට පිටත්ව ගොස් ඇති බවය. තවද පැමිණිලිකාරිය 2015.03.03 වන දින හෝ ආසන්න දිනයක නැවත ලංකාවට පැමිණ ඇත.

මෙම කාලය තුළ පැමිණිලිකාරිය සේවය කළ නිවසේ මන්ද මානසික තත්වයෙන් සිටි අයකු සිටි බවත්, ඇයගෙන් විවිධ අවස්ථාවලදී වධහිංසාවල ලක්වීමෙන් අනතුරුව පැමිණිලිකාරියගේ කකුලට කම්බි කැලි 14ක් ඇතුලත් කළ බවත්, පැමිණිලිකාරියගේ කණට ඇය පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත.

මෙම වධහිංසාව පිලිබදව පැමිණිලිකාරියගේ සහෝදරයා වන පී.වසන්ත අබේසිංහ යන අය විසින් 2013.06.07 දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, නැවත 2013.07.05 දින පීමණිලිකාරියගේ දියණියද දුරකතන ඇමතුමක් ලබා දී පැමිණිලිකාරියගේ පාදයට කම්බිකුරු 08ක් දමා ඇති බව දන්වා ඇති බව වගඋත්තර පාර්ශවයේ වාර්තාවෙන් පැහැදිලි වේ.

මෙම ගැටළුව පිලිබදව පැමිණිලිකරු හා දේශීය නියෝජිත අතර 2013.09.08 දින විදේශ සේවා කාර්යාංශයේදි පැවැති පැමිණිලි පරීක්ෂණයෙන් පසුව ඉහත කී දේශීය නියෝජිත විදේශ සේවා නියෝජිත කාර්යාංශය විසින් ලබාදුන් නියෝගය ඉටු කිරීමට අසමත් වී ඇති බැවින් දේශීය නියෝජිත ආයතනයේ ලියාපදිංචිය හා බලපත්‍ර අනුමැතීන් අත්හිටුවා ඇති බව දක්වා ඇත.

දේශීය නියෝජිත ඔහුගේ වගකීම් නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් ඔහුට දැඩුවමක් ලෙස ඔහුගේ සියළු අනුමැතීන් අත්හිටුවීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශය ක්‍රියා කර ඇත. තවද මෙම පැමිණිලිකාරිය ලංකාවට පැමිණීමෙන් පසුව රැකියා නියෝජිතට දැන්වීමෙන් පසු වෛද්‍ය ප්‍රතිකාර සදහා රු.50,000/= ක මුදලක් වාර දෙකකදී ලබා දී ඇති බවද නිරීක්ෂණය වේ.

ඉහත කී සියළු කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ පැමිණිලිකාරිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් විදේශගතවී ඇති අතර. නියමිත ගිවිසුම් කාල සීමාව ඇතුළත මෙම විදේශ රැකියා ලාභියාට යම්කිසි ගැටළුවකට මුහුණ දීමට සිදුවන්නේ නම් විදේශ සේවා නියුක්ති කාර්යාංශය MBSL රක්ෂණ සමාගම අතර ඇතිකර ගත්තා වූ ගිවිසුමේ උපලේඛණයේ සඳහන් ආකාරයට ඔහුට හෝ ඇයට වන්දි මුදල් ලබාදීම පිළිබඳ විස්තර කර ඇති බවය. එම උපලේඛනයේ සඳහන් ආකාරයට ඔහුට හෝ ඇයට වන්දි මුදල් ලබා දීම පිළිබඳ විස්තර කර ඇති බවය. එම උපලේඛනයට අනුව මෙම පැමිණිලිකාරිය අයත් වන්නේ උප ලේඛණයේ පළවෙනි වගන්තියේ 1.1 උප වගන්තියට අනුවය. එබැවින් රක්ෂණ සමාගම පැමිණිලිකාරියට නීත්‍යාණුකූල රාමුව තුළ හැකි උපරිම සහනය ලබා දී ඇති බව පෙනී යයි.

තවද එම උප ලෙඛණයේ 2-5 දක්වා වූ වගන්ති වල සඳහන් කරුණු සලකා බැලීමේදී එහි ගණයකට නොවැටෙන බවත්. ඇයට හිමිවන්නේ විදේශගත ශ්‍රමිකයෙකු අදාළ කොන්ත්‍රාත් කාලය ඇතුළත හදිසි අසනීපයක් මත හෝ වධහිංසාවක් මත හෝ හදිසි අනතුරක් යන හේතු තුන මත එම කොන්ත්‍රාත් කාලය ඇතුළත ලංකාවට පැමිණියහොත් රක්ෂණයෙන් ආවරණය වන බවත්ය. ඊට අදාළ ගුවන් ටිකට්පත් මුදල රු25,000/ ක මුදල පැමිණිලිකාරියට රක්ෂණ සමාගම විසින් ගෙවා ඇත.

මෙකී සමස්ත කරුණු අනුව.

01. මෙම පැමිණිලිකාරියට සෞදි අරාබියේ ගෘහ සේවිකාවක් වශයෙන් සේවය කළ කාලසීමාව තුළ මාස කිහිපයක මාසික වැටුප ලබා දී නොමැති බව පෙනී යන හෙයින් එම වැටුප වහාම ලබා දීමට කටයුතු කරන ලෙසට වගඋත්තරකාර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

02. පැමිණිලිකාරිය විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාර. පැමිණිලිකාරියට ඇය සේවය කළ කාලසීමාව ඇතුළත යම්කිසි ශාරීරික හෝ මානසික වධහිංසාවට ලක් වී තිබේ නම් වධහිංසාවට ලබාදුන් වන්දිය ඉතා අඩු එකක් බවත්. එම වන්දිය ගණනය කිරීමේදී පැමිණිලිකාරියට සිදුවී ඇති ශාරීරික හානිය පිළිබඳව සාධාරණව වගඋත්තර පාර්ශවය විසින් සලකා බැලීමක් සිදුවී තිබේදි යන්න නැවත වතාවක් සොයා බලා අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ වාර්තාව මත එම තත්වය තහවුරු කරගෙන නොමැති බවත් පෙනී යන හෙයින් නැවත වතාවක් පැමිණිලිකාරියව පිළිගත් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් හරහා පරීක්ෂණයකට ලක් කිරීමෙන් පසුව රක්ෂණ වන්දිය ලබාදීමට කටයුතු කරන ලෙසද 01 හා 02 වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

2023.01.23 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/- Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka